// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2459/11 - 2025 ඔක්තෝබර් මස 21 වැනි අඟහරුවාදා - 2025.10.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

යොමු අංකය: MTR/LND/ACQUI/L1/3997.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: 4-3/9/2017/WS/458.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාවය ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 427, නාවිමන දකුණ ග්‍රාම නිලධාරි වසමට අයත් හුංගන්ගොඩ ගමේ කැඩැස්තර සිතියම් අංකය 820049 පිඹුරේ කලාප 02, පත්‍ර 01හි කැබලි අංක 01, 02, 03 ලෙස සඳහන් ඉඩම් මාතර IV වන අදියර ජල සම්පාදන ක්‍රමය යටතේ ලවණ බාධකය ඉදිකෙරෙන ඉඩමට ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක පරවශතාවය අත්කර ගෙන තිබේ.

උපලේඛනය

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: පහලවත්ත *හෙවත්* වෙලබඩවත්ත; ඉඩමේ විස්තරය: මාර්ගය; ඉඩමේ මුල් හිමිකම් කියන්නා: අංක 65, මහවත්ත නාවිමන දකුණ පදිංචි ශාන්ත සන්ධ්‍යා ලියනගේ, නුවන් චන්දන ලියනගේ සහ පැහැසර, නාවිමන දකුණ, මාතරහි පදිංචි චම්පා ලියනගේ, ලක්ෂ්මන් ලියනගේ සහ තවත් අය; ප්‍රමාණය: හෙක්. 0.0100.

02. **කැබලි අංක 02**

ඉඩමේ නම: අඹගහවත්ත; ඉඩමේ විස්තරය: මාර්ගය; ඉඩමේ මුල් හිමිකම් කියන්නා: අඹගහවත්ත, නාවිමන දකුණහි පදිංචි නුරානි සාදරා ලියනගේ; ප්‍රමාණය: හෙක්. 0.0050.

03. **කැබලි අංක 03**

ඉඩමේ නම: පරමඤ්ඤකැටිය; ඉඩමේ විස්තරය: මාර්ගය; ඉඩමේ මුල් හිමිකම් කියන්නා: "සමගි", නාවිමන දකුණ හි පදිංචි ජේමානන්ද ලියනගේ සහ තවත් අය; ප්‍රමාණය: හෙක්. 0.0296.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2025 නොවැම්බර් මස 24 වැනි දින පෙ. ව. 10.00 ට මාතර කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2025 නොවැම්බර් මස 17 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

**සුසන්ත අත්තනායක,**
ප්‍රාදේශීය ලේකම්,
මාතර - කඩවත්සතර.

2025 ඔක්තෝබර් මස 14 වැනි දින,
මාතර කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 10 - 0201

1A - G 45633 - 13 (2025/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*